ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 29/03/2021

පැමිණිලි පාර්ශවය : බී.ඩබ්.ඩී.එම්.ආර්. ධර්මකීර්ති මිය,
අංක 401, කටුපොත,
බඹරගස්වැව, ගලේවෙල.

වගඋත්තර පාර්ශවය : 01 පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ,
මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව,
මහනුවර.

02 මධ්‍යම පළාත් අධ්‍යාපන ලේකම්,
මධ්‍යම පළාත් අධ්‍යාපන අමාත්‍යංශය,
පල්ලේකැලේ, කුණ්ඩසාලය.

<u>පැමිණිලි අංකය</u> : **<u>HRC/K/166/15</u>**

පැමිණිල්ල :-

ඉහත පැමිණිලිකාරිය විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, තමා මප/ග/මධ්‍ය මහා විද්‍යාලයේ නියෝජ්‍ය විදුහල්පති ලෙස සේවය කරමින් සිටියදී 2015.03.17 වන දින එම විදුහලේ සේවය කළ විදුහල්පති විශ්‍රාම ගිය බවත්, ඒ වන විට එහි සිටි ජ්‍යෙෂ්ඨතම නියෝජ්‍ය විදුහල්පති වූ තමාට ලොග් සටහනක් මඟින් වැඩභාරදීමට කටයුතු කළ බවත්ය.

තමා විද්‍යාවේදී උපාධිය, පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව හා අධ්‍යාපනපති පශ්චාත් උපාධිධාරියෙකු වන බවත්, 2009.11.13 වන දින සිට විදුහල්පති 2 (II) ශ්‍රේණියට පත්වූ බවත්, 2015.11.13 වන විට විදුහල්පති සේවයේ I ශ්‍රේණියට යාමට අවශ්‍ය සුදුසුකම් සියල්ල තමා විසින් සපුරාගෙන තිබූ බවත් දක්වා ඇත.

මප/ග/ගලේවෙල මධ්‍ය මහා විද්‍යාලය 1 AB ශ්‍රේණියේ පාසලක් බැවින් නීතියට අනුව එවැනි පාසලක විදුහල්පති ධූරය ඇබෑර්තු වීමේදී ගැසට් කළ යුතු බවත්, නමුත් ඒ සඳහා ඉල්ලුම්පත් කැඳවා නොතිබූ

ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541 / 74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrc@gmail.com
දුරකථන / தொலைபேசி: 94 -11- 2505580 / 81 / 82
ලේකම් / செயலாளர்: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு: 1996
වෙබ් / இணையம்: www.hrcsl.lk

බවත්, ඒ තුළින් ප්‍රදේශයේ පැසැල්වල සිටින අදාළ සුදුසුකම් ඇති විදුහල්පතිවරුන්ට එම පුරප්පාඩුව සඳහා ඉල්ලුම් කිරිමට අවස්ථාව අහිමි කර ඇති බවත් දක්වා ඇත.

ඒ අනුව ගලේවෙල මධ්‍ය මහා විද්‍යාලයට පත්කර එවා තිබූ විදුහල්පතිවරයාට තමාගේ අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්වලට වඩා සුදුසුකම් අඩුවීම හා සම ශ්‍රේණියේ සිටීම නිසා එම විදුහල්පතිවරයාට වැඩභාරදීම තමා විසින් ප්‍රතික්ෂේප කරන ලද බවත්, එවිට ගලේවෙල කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ, සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ හා කොට්ඨාශ අධ්‍යාපන අධ්‍යක්ෂ යන අය පාසලට පැමිණ නීති විරෝධී ලෙස බලෙන් ලොග් සටහන් තබා එච්. විජේරත්න යන අයට විදුහල්පති තනතුරේ වැඩභාරදුන් බවත් සඳහන් කර ඇත.

අදාළ පාසලේ ඇබෑර්තු වූ විදුහල්පති තනතුරට ගලේවෙල කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් දිවුල්කොටුව විදුහලේ විදුහල්පතිවරයා නිර්දේශ කර අධ්‍යාපන ලේකම්වරයා වෙත යවා තිබුනු බවත්, එම තනතුර සඳහා තමා ඇතුළුව ඉල්ලුම් කළ අනෙක් අයවලුන්ගේ ඉල්ලුම්පත් නිර්දේශ කර පළාත් ලේකම් වෙත යොමු කළද ඒවා නොලැබුනු බව ලේකම්වරයා ප්‍රකාශ කරන ලද බවත් දක්වා ඇත. ඒ අනුව අධ්‍යාපන ලේකම්වරයා තමාගේ අභිමතය පරිදි සුදුසුකම් සපුරා නොමැති පුද්ගලයෙකු එම පාසලට පත්කිරිමට කටයුතු කළ බැවින් සුදුසුකම් සපුරා ඇති තමාට එයින් අසාධාරණයක් සිදුවූ බවත්, ඒ පිළිබඳව පරික්ෂා කර බලා සාධාරණයක් ඉටුකර දෙන ලෙසත් කොමිෂන් සභාවෙන් ඉල්ලා ඇත.

මේ සම්බන්ධයෙන් වගඋත්තර පාර්ශවය වෙතින් වාර්තාවක් කැඳවා ඇතත්, වගඋත්තර පාර්ශවය ඒ සම්බන්ධයෙන් කිසිදු ප්‍රතිචාරයක් දක්වා නොමැත.

**විමර්ශනයේදී අනාවරණය වී ඇති කරුණු :-**

පැමිණිලිකාරිය මප/ග/මධ්‍ය මහා විද්‍යාලයේ නියෝජ්‍ය විදුහල්පති ලෙස කටයුතු කර ඇති අතර, පාසලේ හිටපු විදුහල්පතිවරයා 2015.03.17 දින විශ්‍රාම යන අවස්ථාවේදී පැමිණිලි පාර්ශවයට ලොග් සටහනකින් වැඩ භාරදී ඇති බව පෙනී යයි.

පැමිණිලිකාරිය අදාළ පාසලේ විදුහල්පති තනතුරේ රාජකාරී කරමින් සිටියදී වෙනත් කලාපයක විදුහල්පතිවරයෙකු අදාළ පාසලේ විදුහල්පති ලෙස පත්කර එවා ඇති නමුත් ඔහු පැමිණිලිකාරියට වඩා අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් අසමාන වීම හේතුවෙන් ඔහුට වැඩභාරදීම ප්‍රතික්ෂේප කර ඇති නමුත්, සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරයෙකු හා කොට්ඨාශ අධ්‍යාපන අධ්‍යක්ෂවරයෙකු පාසලට එවා ලොග් සටහන් මගින් එම විජේරත්න යන අයට 2015.03.18 දින වැඩභාරදී ඇති බව නිරීක්ෂණය වේ.

මෙම පාසල 1 AB ශ්‍රේණියේ පාසලක් බැවින් එවැනි පාසලක විදුහල්පති ධූරය ඇබෑර්තුවීමේදී එය ගැසට් කළයුතු නමුත් ගැසට් කර නොමැති බවද නිරීක්ෂණය වේ.

ගලේවෙල කළාප අධ්‍යාපන අධ්‍යක්ෂකගේ 2015.01.22 දිනැතිව මධ්‍යම පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් වෙත යොමුගත ලිපිය මඟින් පුරප්පාඩු වන ගලේවෙල මධ්‍ය මහා විද්‍යාලයේ විදුහල්පති තනතුර සඳහා විදුහල්පති සේවයේ 2 ශ්‍රේණියේ ජ්.එම්.කේ අධිකාරි යන අයව ස්ථානගත කිරීම සුදුසු බවට නිර්දේශ කර ඇතත්, ඒ සඳහා පළාත් අධ්‍යාපන ලේකම් කටයුතු කර නොමැත.

මධ්‍යම පළාත් අධ්‍යාපන ලේකම්ගේ 2015.04.06 දිනැති ලිපිය අනුව පැමිණිලිකාරියව මප/ග/දිවුල්ගම්කොටුව ප්‍රාථමික විද්‍යාලයට අනුයුක්ත කර ඇත.

අධ්‍යාපන අමාත්‍යාංශ 98/13 චක්‍රලේඛය අනුව 1 AB ශ්‍රේණියේ පාසලක විදුහල්පති තනතුර පිරවීමේදී ගැසට් කළ යුතු බවට පැහැදිලිව තිබියදී මධ්‍යම පළාත් අධ්‍යාපන ලේකම් විසින් කිසිදු ගැසට් කිරීමක් සිදුනොකර මහනුවර කලාපයේ විදුහල්පතිවරයෙකු එම විදුහල්පති තනතුර සඳහා පත්කර එවීම මඟින් පැමිණිලිකාරියට ඒ සඳහා ඉල්ලුම් කිරීමට ඇති අවස්ථාව අහිමි වී ඇති බව තහවුරු වේ.

ගලේවෙල කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් 2015.03.06 දිනැති පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ මඟින් පළාත් අධ්‍යාපන ලේකම් වෙත යවන ලද ලිපිය මහින්ද එච්.එම් විජේරත්න යන අයගේ ඉල්ලීම සමඟ ඊට පෙර ඉදිරිපත් කර ඇති ගලේවෙල මධ්‍ය මහා විද්‍යාලයේ විදුහල්පති තනතුරට අයදුම් කළ අයගේ ඉල්ලීමද සලකා බලා අදාළ පුරප්පාඩු සඳහා සුදුසු කෙනෙකු පත්කරන ලෙස ඉල්ලා ඇති නමුත් අනෙකුත් අයවලුන් පිළිබඳව සලකා බලා නොමැති බව පෙනී යයි.

පැමිණිලි විභාගයේදී පළාත් අධ්‍යාපන ලේකම් වෙනුවෙන් පෙනී සිටි නීති නිලධාරි සඳහන් කර ඇත්තේ, එච්.එම් විජේරත්න යන අයගේ අයදුම්පත පමණක් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් නිර්දේශ කර එවා තිබූ බැවින් එම ඉල්ලීම අනුව අදාළ තනතුරට එච්.එම් විජේරත්න යන අයව පත්කර ඇති බවයි. එහෙත් ගලේවෙල කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් ලියාපදිංචි තැපැල මඟින් අනෙකුත් ඉල්ලුම්කරුවන්ගේ අයදුම්පත් මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව වෙත එවා ඇති බව තහවුරු වේ.

උක්ත පැමිණිල්ලට අදාළව 2015.09.29 දින කොමිෂන් සභාවේ පැවැති පරීක්ෂණයේදී ගලේවෙල කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් එවා ඇති විදුහල්පති තනතුරට අදාළ ඉල්ලීම් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ලැබී තිබේද යන්නත්, ලැබී තිබේනම් ඒවා පළාත් අධ්‍යාපන ලේකම් වෙත නිර්දේශ කර යවා තිබේද යන්නත් කොමිසම වෙත දැනුම්දෙන ලෙස දන්වා ඇතත්, ඒ සඳහා පිළිතුරු ලබා දීමට

පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ අපොහොසත් වීම මගින් පෙනී යන්නේ අදාළ ඉල්ලීම පිළිබඳ ලිපි අස්ථානගත වී හෝ අස්ථානගත කර ඇති බවයි.

පරීක්ෂණවලදී පැමිණිලිකාරියගේ මාස 03 ක වැටුප් මේ දක්වා ලබාගැනීම සඳහා ගලේවෙල මධ්‍ය මහා විද්‍යාලයට යාමට නොහැකි බැවින් එය ලබා ගැනීමට සුදුසු ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙස වගඋත්තර පාර්ශවය වෙත අවස්ථා කිහිපයකදී දන්වා ඇතත්, ඒ සඳහා ක්‍රියාමාර්ග ගැනීමට වගඋත්තර පාර්ශවය අපොහොසත් වී ඇත.

නිගමනය :-

පැමිණිලිකාරියට විධිමත් ආකාරයට තාවකාලිකව අදාළ විදුහලේ විදුහල්පති තනතුරේ රාජකාරී පවරා තිබියදී, අදාළ විදුහල්පති පුරප්පාඩුව සඳහා ගැසට් මගින් ඉල්ලුම්පත් කැඳවා විදුහල්පතිවරයෙකු පත්නොකර, අවිධිමත් ආකාරයට පැමිණිලිකාරියට වඩා අඩු සුදුසුකම් සහිත වෙනත් කලාපයක පාසලක නියෝජ්‍ය විදුහල්පතිවරයෙකු ලෙස කටයුතු කළ අයෙකු පත්කිරීම මගින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මගින් සහතික කොට දී ඇති පැමිණිලි පාර්ශවයේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවට පරීක්ෂණයෙන් අනතුරුව නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

01. ගලේවෙල මධ්‍ය මහා විද්‍යාලයේ විදුහල්පති තනතුර සඳහා විධිමත් ආකාරයට ගැසට් කර අයදුම්පත් කැඳවා විදුහල්පතිවරයෙකු පත්කර ගැනීමටත්,

02. පැමිණිලි පාර්ශවයට මේ දක්වා ගෙවා නොමැති මාසවල වැටුප කඩිනමින් ගෙවීමටත් වගඋත්තර පාර්ශවය විසින් පියවර ගත යුතු බවට මෙයින් නිර්දේශ කරනු ලැබේ.

03. එසේම අදාළ තනතුර සඳහා ඉල්ලුම් කළ අයගේ ඉල්ලුම්පත්‍ර අස්ථානගතවීම හෝ අස්ථානගත කිරීමට වගකිවයුතු අය සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා ලේකම්, අධ්‍යාපන අමාත්‍යංශය විසින් පියවර ගැනීමට කටයුතු කළ යුතු බවටද නිර්දේශ කරනු ලැබේ.

2020.05.12 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

A. Shanmuganathan

අනුසූයා ෂන්මුගනාදන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

**Ms. Anusuya Shanmuganathan**
Commissioner
Human Rights Commissioner of Sri Lanka

ම.හේ. නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

**Dr. M.H. Nimal Karunasiri**
Commissioner
Human Rights Commission of Sri Lanka

පිටපත :- 01. ගරු අමාත්‍යතුමා,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

02. ලේකම්, - ඉහත (03) නිර්දේශය අනුව කටයුතු කිරීමට
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

B/